www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහා "විපරම්කරුගේ" සිට පාප්වරයා දක්වා: 16 වැනි බෙනඩික්ට් අනාගමිකත්වයට හා ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි කුරුස යුද්ධයේ නායකත්වයට

**From “grand inquisitor” to pope: Benedict XVI to head crusade vs secularism, democracy**

**පීටර් ෂ්වාට්ස් විසිනි / 2004 අප්‍රේල් 21 දින**

ජෝසෆ් රැට්සිංගර් නව පාප්වරයා වසයෙන් තෝරාගැනීමත් සමග රෝමානු කතෝලික වංශාධිකාරය සියහිස මත තබාගෙන ඇත්තේ පල්ලි ලබ්ධියේ දැඩි මතධාරී බලධරයෙක් ද, මාක්ස්වාදයේ පමනක් නොව ලිබරල්වාදයේ ද, අනාගමිකත්වයේ ද, විද්‍යාවේ හා නූතන වූ සියල්ලෙහි ම පාහේ විරුද්ධවාදී වතිකානුවෙකි.

16 වැනි බෙනඩික්ට් පාප්වරයා ලෙස නම් පට බැඳ ගත් 78 හැවිරිදි කාඩිනල් තෙමේ පාප් ධූරයේ නොවරදිනසුලුභාවය, සමලිංගිකත්වය, දික්කසාදය, ගබ්සා කිරීම හා උපත් පාලනය වැනි ප්‍රශ්න පිලිබඳව කතෝලික ලබ්ධිය ප්‍රශ්නයට බඳුන් කල දේවධර්මාචාරීන් හා පූජකයන් විනය ගත කිරීම ද ඇතුලත් දෙවැනි ජුවාම් පාවුලු පාප්වරයාගේ ධර්මතාවයේ සම්මතයන්හි විසඳුම්කරු ලෙස 23 වසරක් සේවය කලේ ය. කතෝලික පරීක්ෂන සභාවේ අනුප්‍රාප්තික ආයතනය වූ ශ්‍රද්ධාවේ ධර්මතාවෙහි ආගමික සභාවේ මූලිකයා ලෙස රැට්සිංගර්, සිය ජර්මානු සගයන් අතර "ඩර්පෙන්සකාඩිනල් ලෙස ද "මහා විපරම්කරුවා" ලෙස ද අන්වර්ථ නාමයන් පටබැඳ ගනිමින් ලතින් ඇමරිකාවේ දී ඊනියා "විමුක්තියේ දේවධර්මය" වධයට හා මර්දනයට ලක්කල අතර යුරෝපයේ ද උතුරු ඇමරිකාවේ ද ලිබරල්වාදී පූජකයන් වාරනයට, තහනමට හෝ කිතුනු සභාවෙන් නෙරපාහැරීමට කටයුතු කලේ ය.

පාප්වරයා වසයෙන් තෝරාගැනීමට මඳකට පෙර පැවැත් වූ දේශනාව තුල දී "සාපේක්ෂතාවාදයේ ආඥාදායකත්වය" හෙලාදකිමින් රෝමානු කතෝලිකත්වයට පිටින් ඇති සියලු ආගම් සාවද්‍ය බව ප්‍රකාශ කල රැට්සිංගර් සිය ආස්ථානය නිසැක ලෙස යලි අවධාරනය කලේ ය.

කතෝලික පල්ලියේ මුදුන කරා වූ රැට්සිංගර්ගේ නැගීම, ආරම්භයේ දී ශාස්ත්‍රීය මාවත් ඔස්සේ ද, පසුකාලීනව රෝමයේ පාප්වරයාගේ පාලන සභාව තුලින් ද සිදුවිය. 1951 පූජකවරය ලැබීමෙන් අනතුරුව මියුනිච් හි සහකාර පූජකවරයෙක් හා දෙවැනි පූජකවරයා ලෙස කටයුතු කල කෙටි කාලසීමාව සහ මියුනිච් හා ෆ්‍රීසිං හි අගරදගුරු ලෙස සේවය කල සිව් වසර (1977-81 දක්වා) හැරෙන්නට ඔහුට පල්ලියේ සාමාන්‍ය බැතිමතුන් සමග සමීප සබඳතා පැවතියේ නැත.

පාලන සභාව එහි ඉහල ම තනතුරට රැට්සිංගර් තෝරාගත්තේ, අන් සියල්ලට වඩා, පල්ලියේ යාන්ත්‍රනයට හා එහි ධූරාවලියට කැප වී ගත් පාක්ෂික මිනිසෙකු ලෙස ය. ඔහුගේ පූර්වගාමියා වූ දෙවැනි ජුවාම් පාවුලු ගේ මරනය හා නව පාප්වරයා තෝරාගැනීමේ ක්‍රියාවලිය පිලිබඳ මහා මාධ්‍ය ඝෝෂාව මැද්දේ මෙම කාරනය බොහෝ කොට ම නොතකා හරින ලදි.

මාධ්‍ය ආවරනය පැය ගනන් කැපකොට තිබුනේ මධ්‍යකාලීන මැතිවරන සම්ප්‍රදායන්ගේ බහුබූත සඳහා ය. පාප්ගේ මන්දිරයෙහි දුම්කවුලුවෙන් නිකුත් වන සුදු හෝ කලු දුමාරයෙහි වැදගත්කම ගැන වූ නිමක් නැති ප්‍රකාශ සමග රදගුරුන්ගේ කඩා හැලෙන දම්පැහැ ලෝගු වෙතට කැමරා ඇස සාදරයෙන් යොමු වූව ද තෝරාගැනීමේ ක්‍රියාවලියෙහි තරයේ ම ප්‍රජාතන්ත්‍ර විරෝධී හා කුමන්ත්‍රනකාරී ස්වභාවය නිහඬවම ලිස්සා හරිනු ලැබිනි.

සැබවින් ම ඡන්දය දීමට සුදුසුකම් ලත් රදගුරුන් 115 දෙනාගෙන් (සාමාන්‍ය වයස අවු. 71කි) සියලුදෙනා ම පාහේ පත්කරන ලද්දේ බොහෝ විට රදගුරු බලප්‍රදේශයන්හි කටුක විරුද්ධත්වය හමුවේ හා රැට්සිංගර්ගේ පුද්ගලික සහභාගිත්වය ඇති ව, රැට්සිංගර්ගේ පූර්වගාමියා විසිනි. දෙවැනි ජුවාම් පාවුලු පාප්වරයාගේ සමීපතමයා වූ රැට්සිංගර් මීට පෙර පාප්වරුන් දෙදෙනෙකු තෝරා ගැනීම සඳහා සහභාගී වූ අගරදගුරුන් කුඩා කන්ඩායමකට අයත් විය. මාධ්‍ය වාර්තාවලට අනුව අගරදගුරුන් සඳුදා දින රහස් සභා ගැබට පිවිසෙන අවස්ථාව වන විට පාලන සභාවේ ඔහුට පැවති බලපෑම් මත පදනම් වූ ස්ථිර ඡන්ද 50ක කුට්ටියක් ඒ වන විටත් ඔහු පිටුපස පැවතුනි. තේරීපත්වීම සඳහා ඔහුට ඡන්ද 77ක් අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලය වසයෙන් ඊනියා ප්‍රතිසංස්කරන අපේක්ෂකයන් වූ ඉතාලියේ කාලෝ මරියා මාටිනී හා දකුනු ඇමරිකාවේ අගරදගුරුන් ගනනාවකට ම තේරී පත්වීමට සැබෑ අවස්ථාවක් නො තිබුනි. මැතිවරන ක්‍රියාවලිය මත ආගමික සභාවේ පාලනය, දෙවැනි ජුවාම් පාවුලු විසින් හඳුන්වාදුන් ඡන්දය දීමේ නව

ක්‍රමයක් මගින් තවදුරටත් ශක්තිමත් කරන ලද අතර, ඡන්ද වට 30 කින් පසුව තුනෙන් දෙකක බහුතරයක් නො ව, සරල බහුතරයක් නව පාප්වරයා තෝරා ගැනීමට ප්‍රමානවත් විය. මෙම රෙගුලාසිය සුලුතර අපේක්ෂකයන්ගේ හා කන්ඩායම්වල තත්වය දුර්වල කලේ ය. මේ අනුව සම්මුතිවාදී අපේක්ෂකයෙක් පිලිගැනීමට ඔහුගේ ආධාරකරුවන් පොලඹවන තාක් දුරට මැතිවරන ක්‍රියාවලිය ඇදගෙන යාමට රැට්සිංගර්ගේ විරුද්ධවාදීහු අපොහොසත් වෙති.

සාමාන්‍ය කතෝලික බැතිමතුන් — පල්ලියට අනුව ලොව පුරා එක් බිලියනයක් වන — මේ ක්‍රියාවලිය තුල කුමනාකාරයක හෝ වැඩ කොටසක් ඉටු කරනු නො ලැබුනි. ලෝකයේ ඉතා බලගතු හා ධනවත් ම ආයතන අතුරින් එකක ප්‍රධානියා තෝරාගැනීමේ දී ඔවුන්ට සුලු හෝ බලපෑමක් කල නො හැකි ය.

තව ද පාප්වරයා පල්ලිය තුල ඒකාධිපති බලතල ක්‍රියාත්මක කරයි. ඔහු සිය ඉතිරි ජීවිත කාලය පුරාම පාලනයේ යෙදී සිටින අතර ඔහු ගේ ආඥාවන් “නො වරදින සුලු” යයි සැලකේ; පල්ලියේ ධූරාවලිය තුල සෑම ප්‍රධාන තනතුරක් ම දරන්නවුන් පුද්ගලිකව ම පත්කිරීමට ඔහුට හැකි ය; පල්ලියේ කටයුතු පාලනය කරන නීති සිය කැමැත්ත පරිදි වෙනස් කිරීමට ද ඔහුට හැකි ය.

## පොලිස් භටයාගේ පුත්‍රයාගේ සිට "මහා විපරම්කරු" දක්වා

ජෝසෆ් රැට්සිංගර්, මාක්ල් ඈම් ඉන් නම් බැවේරියානු නගරයේ පොලිස් භටයෙකුට දාව 1927 දී උපත ලැබී ය. 14 වැනි වියේ දී හිට්ලර්ගේ තරුන ව්‍යාපාරයට ජෝසෆ් සම්බන්ධ විය. තමන්ට ඊට එක්වන ලෙස බලකරනු ලැබුවේ යයි පසු කලෙක දී ඔහු ප්‍රකාශ කලේ ය. නො එසේ යයි ඇඟවෙන කරුනු සොයාගත නො හැකි ය. පල්ලියේ නායකයන් හා නාසි නායකත්වය අතර යහපත් සබඳතාවක් පැවතියේ වී නමුදු, ඔහු හැදී වැඩුනු කතෝලික කවයන් නාසීන්ගෙන් ඈත් ව සිටීමට වගබලා ගත්හ. එදිරිවාදිකම් මතු වූයේ කතෝලික පල්ලිය තමන් රැකගෙන සිටින්නා වූ ජීවන රටාවේ විවිධ අංශවලට නාසීන් ඇඟිලි ගසන්නේ යයි සැලකීම නිසා ය.

කෙසේ වුව ද නාසි ආඥාදායකත්වය සමග පැවති ඔහුගේ අත්දැකීම් මත රැට්සිංගර් වැඩී ආවේ දැනුවත් ප්‍රජාතන්ත්‍රවාදියෙකුට වඩා ආධානග්‍රාහී කතෝලිකයෙකු ලෙස ය යන්න නිසැක කරුනකි.

යුද්ධාවසානයේ දී ඔහු දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමට පටන්ගත් අතර 1951 දී පූජකවරයෙක් ලෙස පත්කරනු ලැබීන. 1953 දී ඔහු දේවධර්මය පිලිබඳ ආචාර්ය උපාධිය ලබාගත් අතර 1957 දී තිස්හැවිරිදි වියට පත්වන විට මියුනිච් විශ්වවිද්‍යාලයේ මූලික දේවධර්මය පිලිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස සුදුසුකම් ලැබී ය. 1954 සිට 1981 දක්වා ඔහු මූලික දේවධර්මය, ධර්මතාවන් හා එහි ඉතිහාසය ජර්මානු විශ්වවිද්‍යාල ගනනාවකම ඉගැන්වී ය.

එම කාලසීමාව තුල ම ඔහු සභා ධූරාවලියෙහි ඉහලට නැගීම ආරම්භ කලේ ය. 1962 සහ 1965 අතර ඔහු දෙවැනි වතිකානු කවුන්සිලයේ නිල දේවධර්මාචාර්යවරයා වසයෙන් එහි වැඩ කටයුතුවලට සහභාගි විය. 1977 මාර්තු මාසයේ දී ඔහු මියුනිච් හා ෆ්‍රීසිංහි රදගුරු වසයෙන් පත්කල අතර යන්තම් තෙමසකට පසුව අගරදගුරු තනතුරට උසස් කරන ලදි. අනාගත දෙවැනි ජුවාම් පාවුලු පාප්වරයා බවට පත් වූ පෝලන්තයේ අගරදගුරු කැරොල් වොජ්ටිලා සමග දැනහැඳුනුම්කම් වැඩි වර්ධනය වූයේ මෙම කාලයේ පටන් ය.

1981 දී ජුවාම් පාවුලු පාප්වරයා ලෙස පත් කරනු ලැබීමෙන් තෙවසරකට පසුව ඔහු රෝම භක්තියේ උත්තරීතර භාරකාරයාගේ තැන ගැනීමට රැට්සිංගර් කැඳවී ය.

1960 ගනන්වල දෙවැනි වතිකානු කවුන්සිලයේ කාලසීමාව තුල රැට්සිංගර් සලකනු ලැබුවේ සාපේක්ෂ ව ලිබරල්වාදියෙකු ලෙස ය. "දේවධර්මයේ සදොස් ආස්ථානයන් බලහත්කාරීව පිලිගැන්වීමට" ටුබින්ජන්හි දේව ධර්මාචාර්ය හැන්ස් කුන්ග් සමග ඔහු 1968 දී විරුද්ධ විය.

ඔහුගේ චරිතාපදායකයන්ට ද ඔහුගේ මතක සටහන්වලට ද අනුව 1960 ගනන්වල වාමාංශික ශිෂ්‍ය විරෝධතාවන් හා කම්කරු අරගලයන් ඇවිලී යෑම රැට්සිංගර් කෙරෙහි ප්‍රගාඪ බලපෑමක් ඇති කල අතර ඔහු දකුනට තල්ලුකරමින් ඔහුගේ ගැඹුරු දේශපාලන ඉව — එනම් සමාජවාදී විප්ලවය කෙරෙහි වෛරය හා භීතිය — පෙරට ගෙන ආවේ ය. පසුකාලීනව භක්තියේ ධර්මතාවය උදෙසා වූ ආගමික සභාවේ ප්‍රධානියා ලෙස ඔහු වතිකානුවේ බලපෑම් මත තනතුරෙන් පහකල හැන්ස් කුන්ග් ද ඇතුලු විවේචනශීලී දේව ධර්මාචාර්යවරුන්ට එරෙහිව බලහත්කාරී පියවරයන් ගනු ලැබී ය.

"මහා විපරම්කරුවා" ලෙස ඔහු ඇඩිව ක්‍රියාවට නැගූ ප්‍රතිගාමී ආස්ථානයන් බොහෝ කතෝලිකයන් අතර ද දැඩි විරෝධය ඇවිලවීය. උපත් පාලනය හා ගබ්සාව හෙලා දැකීම, කාන්තාවගේ යටත්වීම අවධාරනය කිරීම, මූල සෛල (stem cells) පර්යේෂන හෙලා දැකීම, පල්ලියේ ජීවිතය තුල ගිහියන්ගේ ක්‍රියාකලාපය වර්ධනය කිරීමට එරෙහි වීම, පූජකයන්ට විවාහ වීම තහනම් කිරීම, සමලිංගික සබඳතාවන් පිලිකුල් කිරීම ඇතුලු පාප් මන්දිරයේ ආඥා නියෝග සියල්ල රැට්සිංගර්ගේ අත්සන දරා සිටියි. ඔහු ස්වයං ලිංගික තෘප්තිය වරදක් ලෙස නිල වශයෙන් ප්‍රකාශ කිරීමට තරම් දුර ගමන් කලේ ය.

පසුගිය වසර තරම් මෑතක දී "ලෝකය තුල හා පල්ලිය තුල මිනිසාගේ සහ ගැහැනියගේ සහභාගිත්වය පිලිබඳ ලිපිය" නමින් යුත් පිටු 37කින් යුත් ලිපියක් ආගමික සභාව විසින් ප්‍රකාශයට පත් කලේ ය. බයිබලය උපුටා ගනිමින් එම ලිපිය, කාන්තාවගේ ක්‍රියාකලාපය, කන්‍යාභාවය ද පසුව විවාහය, මාතෘත්වය හා පවුලේ ගෘහමූලිකයාට සහාය දීම යනුවෙන් අරුත් දක්වයි. ලිපිය, උත්පත්ති 3:16 (බයිබල් පාඨයකි) අනුමැතියෙන් යුතුව උපුටා ගනී: "ඔබගේ කැමැත්ත විය යුත්තේ ඔබගේ ස්වාමි පුරුෂයා ය. ඔහු ඔබ මත පාලනය ගෙනයනු ඇත."

රැට්සිංගර්, දික්කසාද වූ ජෝඩු කෙරෙහි වඩා ලිබරල්

ආකල්පයන් දැක්වීමට විරුද්ධ වූ විට හා ගර්භනී කාන්තාවන්ට උපදෙස් දීමෙන් පල්ලිය ඉවත්ව සිටිය යුතු යැයි ඉල්ලා සිටි විට ජර්මනියේ කතෝලික බැතිමතුන්ගේ පමනක් නො ව රදගුරුවරුන් බහුතරයකගේ ද විරුද්ධත්වයට පාත්‍ර විය. එවන් උපදේශනයන් 1995 පටන් ම නීත්‍යානුකූල ගබ්සාව පිලිබඳ ක්‍රියාමාර්ගවල ද කොටසක් ව පැවතුනි.

පීඩිතයන්ගේ හා දුගීන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමේ දී පල්ලිය පුලුල් වැඩකොටසක් ඉටුකල යුතු යයි කියා සිටි ලතින් ඇමරිකාවේ "විමුක්ති දේවධර්මාචාර්යවරුන්" ට එරෙහිව ඔහු ක්‍රමානුකූල ව්‍යාපාරයක් සංවිධානය කලේ ය. රැට්සිංගර්ගේ අනින් ප්‍රකට විමුක්ති දේවධර්මාචාර්ය ලියනාඩෝ බොෆ් 1992 දී පූජක ධුරයෙන් පහකරන ලදි.

මෙම කරුනු පිලිබඳව රැට්සිංගර් හා දෙවැනි ජුවාම් පාවුලු අතර දැඩි එකඟතාවක් පැවතියේ වී නමුදු කතෝලික පල්ලිය හා අනෙකුත් නිකායන් අතර කිට්ටු සහයෝගිතාවක් වර්ධනය කිරීම පිලිබඳ පාප්වරයාගේ අදහස් සමග භක්තියේ භාරකරුට එකඟතාවක් නො තිබූ බව පෙනෙන්නට තිබුනි. පාප්වරයා විසින් පසුව අත්සන් කරනු ලැබූ, ආගමික පාලන සභාවට ඉදිරිපත් කිරීම සඳහා 2000 වසරේ දී රැට්සිංගර් පිලියෙල කල "ඩොමිනස් ජීසස්" නම් සංදේශය මීට නිදසුනකි. ක්‍රිස්තියානි මෙන් ම ක්‍රිස්තියානි නො වූ වෙනත් නිකායවල නිලධාරීන් විසින් නිග්‍රහයක් ලෙස එක හෙලා සලකන ලද එම ලේඛනයෙන් කතෝලික පල්ලියේ උත්තරීතරභාවය අවධාරනය කලේ ය.

"එක් ක්‍රිස්තුස් වහන්සේ කෙනෙක් සිටින්නාක් සේ ම, ක්‍රිස්තුස්ගේ එක ම ශරීරයක් පවතින්නාක් සේ ම ක්‍රිස්තුස්ගේ එක ම මනාලිය සේ පවතින්නේ එක ම කතෝලික ආගමක් හා අධ්‍යාත්මික පල්ලියකි."

රැට්සිංගර්ගේ ලෝක දෘෂ්ඨියෙහි අරටුව වන්නේ ප්‍රබුද්ධත්වය හා නවීනත්වය ප්‍රතික්ෂේප කිරීම යි.

ඩි සෙයිට් නම් ජර්මානු පුවත් පත මීට වසරකට පෙර ඔහුගේ දෘෂ්ඨිය මෙසේ සාරාංශගත කලේ ය. "යමෙක් රැට්සිංගර්ගේ පැරනිතම ලේඛන විශ්වාස කරන්නේ නම් ප්‍රබුද්ධත්වය කරාම ආපසු දිවයන ලිබරල් දර්ශනවාදය අන්තරායකාරී අවිචාරවත් ලබ්ධියකි. විශ්වාසය හා විද්‍යාව අතර පවත්නා වූ දිව්‍යමය බැම්ම එමගින් බිඳ දමා ඇති අතර එයට වඩා ලොකු සත්‍යයක් නො ඉවසයි. ලිබරල් බුද්ධිමතුන් ආත්මීය ආශාවන් සමග ලෝකයේ අන්තරීක්ෂ අර්ථය එකට පටලවයි. ඔවුහු තර්කයට පෙරටුව එන පූර්ව-දේශපාලන ආගමික සත්‍යයට අන්ධ වෙති."

තවත් ජර්මානු පුවත්පතක් වාර්තා කලේ "බෙහෙවින් සංවර්ධනය වූ කාර්මික රටවල් සිය ආත්මයන් හා විශ්වාසයන්ගෙන් අත්මිදෙමින් සිටින බැවින් පවුල හා විවාහය වැනි ඉපැරනි සංස්ථාවන් බිඳ වැටෙමින් තිබෙන අතර එවන් සමාජ බාදනයක් සැලකිය යුතු අවදානමක් හා අන්තරායක් ගෙන එයි." මෙය රැට්සිංගර්ගේ ද ප්‍රියතම තේමාවක් විය. එම කාරනය පිලිබඳව ඔහු සිය පූර්වගාමියා සමග එකඟ වෙයි. "තාක්ෂනය හා සෞභාග්‍ය මත පදනම් වූ අපගේ සංස්කෘතිය ප්‍රාථමික වසයෙන් ඕනෑම දෙයක් සිදුවිය හැකි ය යන ඒත්තු ගැනීම මත පදනම් වෙයි. එවිට දෙවියන් වහන්සේ පිලිබඳ කාරනය තවදුරටත් අදාල නො වේ."

විමුක්තියේ දේවධර්මය වැනි සමාජ අරගලයන් පිලිබඳව අනුකූලතාවක් දැක් වූ ප්‍රවනතාවන්ට එරෙහිව පල්ලිය ඇතුලත විවේචනය කල හා සටන් වැදුනා වූ රැට්සිංගර් දක්ෂිනාංශික හා ඒකාධිපති ප්‍රවනතාවන් සමග ඉක්මනින් ම පෙලගැසුනේ ය. නිදසුනක් ලෙස පැම්ප්ලෝනාහි 1998 පැවති උත්සවයක දී ප්‍රතිගාමී ඕපස් ඩේ නිකායෙහි ප්‍රධානියා වූ ජාවියර් එචවේරියා රොඩ්රිගස් විසින් රැට්සිංගර් ගෞරව උපාධියකින් පුදනු ලැබී ය.

## රැට්සිංගර් හා "සාමයේ පාප්වරයා"

රැට්සිංගර් 16 වැනි බෙනඩික්ට් නාමය තෝරා ගැනීම බොහෝ දෙනෙකු මවිතයට පත්කලේ ය. පොදුවේ බලාපොරොත්තු තබා තිබුනේ ඔහුගේ පූර්වගාමියා අගය කිරීමක් වසයෙන් ඔහු තෙවැනි ජුවාම් පාවුලු යන නාමය යොදාගනු ඇති බව යි. අලුතෙන් පත්කල පාප්වරයාගේ නාමය ක්‍රියාමාර්ගික වැදගත්කමක් සහිත ය යන්න සිත්හි තබාගෙන 1914-1922 දක්වා ප්‍රථම ලෝක සංග්‍රාම කාලපරිච්ඡේදය තුල ශුද්ධ වූ සභාව භාරව සිටි 15 වැනි බෙනඩික්ට් පාප්වරයා මතකයට නගා ගැනීම යෝග්‍ය ය.

15 වැනි බෙනඩික්ට් බොහෝ විට හඳුන්වනු ලැබුවේ "සාමයේ පාප්වරයා" ලෙස ය. රැට්සිංගර් ඔහුගේ සම්ප්‍රදාය සමග පෙලගැසීමට වෑයම් කිරීමේ කාරනය ලිබරල් හා වාම කවයන් තුල බලාපොරොත්තු දැල්වෙන ප්‍රකාශයන්ට තුඩු දුන්නේ ය.

ජර්මානු පාර්ලිමේන්තුවේ හරිත පක්ෂ කන්ඩායමේ නායක කැට්රින් ගෝරිං-එකාඩ් "යමෙකු හිටපු අගරදගුරු රැට්සිංගර් ගැන කෙසේ සලකනු ලැබුවේ ද යන්න නොතකා" ජර්මානු පාප්වරයා සංතුෂ්ටියේ මූලාශ්‍රයක් වී ඇතැයි ප්‍රකාශ කලා ය. තමන් "බෙනඩික්ට්" ලෙස නම් කර ගැනීමේ දී ඔහු හොඳ තේරීමක් කර ඇතැයි සඳහන් කරමින් ඇය වැඩි දුරටත් කියා සිටියේ ඒ "අවසාන බෙනඩික්ට් පාප්වරයා ඔහුගේ කාලය තුල ප්‍රථම ලෝක යුද්ධය අවසන් කිරීම සඳහා වෙහෙස නො බලා උද්ඝෝෂනය කල සාමයේ ශ්‍රේෂ්ඨ නියෝජිතයෙක් වීම නිසා" බව ය.

යථාර්ථයේ දී නම් ප්‍රථම ලෝක සංග්‍රාමය කාලපරිච්ඡේදයේ දී වතිකානුව අනුගමනය කල මැදහත් පිලිවෙතට හා සාමකාමී විසඳුමක් සඳහා බෙනඩික්ට්ගේ ප්‍රයත්නයට අධිරාජ්‍යවාදී ඝාතනය කෙරෙහි වූ ප්‍රතිපත්තිමය විරෝධයක් පැවතියේ ය යන්න කිසිසේත් අදාල නො වී ය. පල්ලියක් මෙන් ම රාජ්‍යයක් ද වූ වතිකානුවට යුද්ධයෙන් සිදුවිය හැකිව තිබුනේ පාඩුවක් පමනක් නිසා එහි ඉක්මන් අවසානයක් සඳහා උනන්දුවක් දැක්වී ය. යුද පෙරමුනේ දෙපැත්තෙහි ම සැලකිය යුතු කතෝලික ජනගහනයක් සහිත ප්‍රධාන බලවතුන් සටනෙහි යෙදී සිටි අතර — එක් පසෙක ප්‍රන්සයත් අනෙක් පසෙහි ජර්මනිය හා ඔස්ට්‍රියා-හංගේරියාව ද වසයෙන් — පැති ගැනීම මගින් වතිකානුව පල්ලිය බෙදීයෑමේ අවදානමට මුහුන ලක් කරනු ඇත.

යුද්ධය ආරම්භවීමටත් පෙර වතිකානුව මහා බලවතුන්ගෙන් විශාල දේශපාලන ස්වාධීනත්වයක් පිහිටුවා ගැනීමට බලාපොරොත්තු විය. කතෝලික බලවතුන්ට විශේෂයෙන් ම ඔස්ට්‍රියා-හංගේරියාවට පාප්වරයා තෝරා ගැනීමේ දී නිෂේධ බලය යෙදීමට පැවති අයිතිය අහෝසි කරන ලද අතර පාප්වරයා තේරීම රහසිගත ආගමික සභාවක් වෙත පවරන ලදි.

යුද්ධය පැනනැගීමෙන් මසකට පමන පසුව 15 වැනි බෙනඩික්ට් පාප්වරයා ලෙස තේරී පත් වූ ගියාකොමෝ ඩෙල්ලා චීසා පලපුරුදු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු විය. ජෙනෝවාහි වංශක්කාර පවුලක උපත ලැබූ ඔහු වතිකානුවේ තානාපතිවරයෙකු ලෙස වසර ගනනාවක් සේවය කලේ ය. යුද්ධය පැවති මුලු කාලය තුල ම ඔහු වතිකානුවේ මැදහත් පිලිවෙත අවධාරනය කල අතර 1917 න් අනතුරුව සාම සාකච්ඡා සඳහා මූලිකත්වය ගැනීමට එක්සත් ජනපද ජනාධිපති වුඩ්රෝ විල්සන් දිරිගැන්වී ය.

රැට්සිංගර් සිය නාමය තෝරාගැනීමේ දී 16 වැනි බෙනඩික්ට් යන්න සිත්හි තබාගෙන සිටියා විය හැකි ය. ඒ කලින් පාප්වරයාගේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු නිසා නො ව රැට්සිංගර් මෙන් ම ඔහු ද නූතනවාදයේ එනම් බුද්ධිවාදයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ හා සියල්ලටමත් වඩා සමාජවාදයේ කටුක විරුද්ධවාදියෙක් වීම නිසා ය.

සිය පදවි ප්‍රාප්තියෙන් යන්තම් මාස කිහිපයකට පසුව 15 වැනි බෙනඩික්ට් පාප්වරයා ප්‍රකාශයට පත්කල අපෝස්තලික ලිපියක ඔහු හේතුවාදය ද අවබෝධය ද පිලිබඳ ව සිය විශ්වාසය පලකල සියල්ලන්ට ම එකහෙලා විරුද්ධත්වය පලකලේ ය. "ස්වභාවධර්මය අධ්‍යයනය කිරීමේ දී අත්කරගෙන ඇති ඇදහිය නොහැකි තරමේ ප්‍රගතිය, දෙවියන් වහන්සේගේ මහඟු දායාදයක් වන මිනිස් බුද්ධියේ අභිමානවත් අදහස් ස්නේහයෙන් යුතුව වැලඳ ගැනීමේ දී ඔවුන් දෙවියන් පිලිබඳව සැඟවුනු කරුනු හා මිනිසාට දෙවියන් විසින් ප්‍රදානය කර ඇති සියල්ල පවා, ඔවුන්ගේ ම මනසේ මට්ටම මගින් මැනීමට මැලි නො වීමට තරම් ඔවුන්ගේ ම විනිශ්චය පිලිබඳ විශ්වාසයෙන් හා පල්ලියේ අධිකාරය ගැන දඩබ්බර වූ පටු කල්පනාවේ ගැලී සිටින්නේ යයි" රැට්සිංගර්ගේ පූර්වගාමියා ගෝරනාඩු කලේ ය. මෙයින් අපගේ පූර්වගාමියා "සියලු දුර්ලබ්ධීන්ගේ සංශ්ලේෂනය" ලෙස නිවැරදිව ප්‍රකාශ කල හා විධිමත් පරිදි හෙලා දුටු "නූතනවාදයේ" දැවැන්ත දෝෂයන් පැනනැගී ඇත.... එබැවින් "කිසිදු නවීකරනයකට ඉඩ නො තබා අපට ලබා දී ඇති දේ රැකගනිමු" යන අපගේ මුතුන්මිත්තන්ගේ නීතිය තවදුරටත් පූජනීය ව රැකගැනීම අපගේ අධිෂ්ඨානය යි."

ප්‍රථම ලෝක සංග්‍රාමය ද හෙලා දකින "ඇඩ්බීට්සිමි ඇපොස්ටොලරම්" යන 1914 නොවැ. 1 වැනි දින නිකුත් වූ ආගමික චක්‍රලේඛය තුල මෙම වචන අඩංගුව පවතියි. පාප්වරයාගේ අරමුන වූයේ යුද්ධයේ බලපෑමෙන්, තර්ජනයට ලක්ව ඇති පවත්නා ක්‍රමය ආරක්ෂා කර ගැනීම බව මෙම චක්‍රලේඛයේ පෙල විදහා දක්වයි. වතිකානුව අභිප්‍රේරනය වූයේ රුසියාව, ජර්මනිය, හංගේරියාව හා තවත් බොහෝ රටවල් තුල යුද්ධාවසානයේ දී පැනනැගී තිබුනු සමාජ කලබැගෑනි හා සමාජවාදී නැගිටීම් පිලිබඳ භීතියෙනි. මෙම කාරනය නිසා චක්‍රලේඛය මගින්, පවත්නා බලාධිකාරය කොන්දේසි විරහිතව ආරක්ෂා කරනු ලැබී ය.

එය සකලවිධ ප්‍රජාතන්ත්‍රවාදය ම හෙලා දකියි. "මනුෂ්‍ය බලවේග විශ්වයේ මැවුම්කරු හා පාලකයා වන දෙවියන් වහන්සේගෙන් ස්වාධීනවීමට බැලූ තැන් පටන්, උසස් හා පහත් යන අන්ත දෙක අතර පැවතිය යුතු යුතුකමේ බැම්ම, මිනිසාගේ නිදහස් ප්‍රාර්ථනාව තුල, කොතෙක් දුබල වී ඇත් ද යත් එය නො පවතින තරම් ය.

15 වැනි බෙනඩික්ට් ධනේශ්වර සමාජයේ අර්බුදය සලකනු ලැබුවේ ආගම හා විශ්වාසය වෙතින් ඉවතට හැරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි: "මිනිසාගේ අධිෂ්ඨාන ශක්තිය හා අදහස් වල වෙනස්වීමට ද හේතුකාරක වූ, සංස්ථාවන්ගේ ස්ථාවරත්වය හා සාමය ගැබ්කරගෙන පැවති ක්‍රිස්තියානි ප්‍රඥාවේ භාවිතාවන් හා නියාමයන් රාජ්‍ය පාලනයේ දී පිලිපැදීම නතර වූ තැන් පටන් එමගින් රාජ්‍යයන්ගේ පදනම ම දෙදරුම්කෑමට පටන් ගෙන තිබේ. තව ද එමගින් දෙවියන්වහන්සේ අප ගලවා ගැනීමට නො පැමිනිය හොත් ශිෂ්ටාචාරයේ අවසානය අතලගටම පැමින ඇති බවක් ද පෙන්නුම් කරයි."

රැට්සිංගර් ද අද දින ලෝකය දකින්නේ මෙලෙස ම බව පෙනී යයි.

ඔහුගේ පූර්වගාමියා වූ 2 වැනි ජුවාම් පාවුලුගේ ධුරකාලය තුල පාප්වරයා ද ක්‍රියාශීලි හා වැදගත් වැඩ කොටසක් ඉටුකල, සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ පාලන තන්ත්‍රයන්හි බිඳවැටීම, ආධිපත්‍යය දැරී ය. සොලිඩැරිටි ව්‍යාපාරයේ ධජය යටතේ වර්ධනය වූ පෝලන්ත කම්කරු පන්තියේ බලගතු ව්‍යාපාරය ස්වාධීන සමාජවාදී දිශාවකට වර්ධනය නො වීමට හා කතෝලික පල්ලියේ අනසක යටතේ රඳවා ගැනීමට ඔහු සහතික විය.

රැට්සිංගර් ධුරයට පත්ව සිටින්නේ ඉරාක යුද්ධයේ හෙවනැල්ල තුල ද, ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් අතර වැඩී යන ආතතියක් හා ධනේශ්වර සමාජයේ ගැඹුරු සමාජ හා දේශපාලන අර්බුදයක් ද මධ්‍යයේ ය. ප්‍රජාතන්ත්‍ර විරෝධී, වඩාත් පසුගාමී ආගමික හා අප්‍රබුද්ධ අගතීන් දිරිගන්වමින් ඔහු ප්‍රතිචාර දක්වන්නේ තමා සිය නාමය ලබාගත් පාප්වරයාට සමාන වූ ආකාරයකට ය.

ලොව පුරා සංචාරය කරමින් යුදෙව් හා ඉස්ලාම් ආගම් ද ඇතුලු අනෙකුත් ආගමික කොටස් සමග හොඳ හිත වර්ධනය කිරීමට උත්සුක වූ ඔහුගේ පූර්වප්‍රාප්තිකයාට ද වඩා, 16 වැනි බෙනඩික්ට් ශක්තිමත් ක්‍රිස්තියානි යුරෝපයක අවශ්‍යතාවය අවධාරනය කරයි. පල්ලියේ ඉතිහාසයෙහි ප්‍රකට බෙනඩික්ට්වරයා වන බෙනඩික්ට්යානු නිකායෙහි ආරම්භකයා වූ නර්සියාවේ බෙනඩික්ට් ද, යුරෝපයේ පූජනීය ශාස්තෘවරයා ලෙස සයවන පාවුලු පාප්වරයා විසින් 1964 දී ප්‍රකාශයට පත්කල බව බොහෝ විචාරකයන් විසින් පෙන්වා දී තිබේ.

© www.wsws.org